# ඇමරිකන් යටත්විජිතවාදය හා එහි ගැත්තන් පරාජය කරමු

ඇමරිකා එක්සත් ජනපදය අද ලෝක බලවතා බව තමන්ටත් අපටත් නැවත නැවතත් සනාථ කරමින් සිටියි. ඉරාකය මෙල්ල කර යටත් කර ගත් බුෂ් දැන් වෙනත් මුස්ලිම් රටවලට ද අත පෙවීමට සූදානම් වෙයි. බුෂ් පළමුව ඇෆ්ගනිස්තානයට පහර දී ඒ විනාශ කෙළේය. ඉන් පසු ඒ රට නැවත ගොඩනගන බවට ප්‍රතිඥා දුන්නේය. දැන් ඔහු ඉරාකය සම්බන්ධයෙන් ද ඒ දෙයම කියයි. එහෙත් මේ එකක්වත් ඒ ආකාරයෙන් ම සිදුවන දෑ නොවේ. ඇමරිකාවට මුස්ලිම් රටවල් ගොඩනැගීමට අවශ්‍ය නොවේ. ඊනියා දෙවැනි ලෝක යුද්ධයෙන් පසුව ජර්මනිය ගොඩනැංවීමට ආධාර කළ අන්දමට මුස්ලිම් රටවල් සම්බන්ධයෙන් ද ඇමරිකාව ක්‍රියා කරනු ඇතැයි බලාපොරොත්තු විය හැක්කේ දේශපාලන මුග්ධයකුට පමණය.

ඇමරිකාවට ඉරාකයේ තෙල් ළිං වැදගත් බව සැබෑය. එහෙත් ක්‍රිස්තියානි ඇමරිකාව ක්‍රිස්තියානි බ්‍රිතානිය සමග එකතු වී ඉරාකයට පහර දුන්නේ තෙල් ළිං ටික ආරක්ෂා කර ගැනීමට පමණ යැයි කිව හැක්කේ යල් පැන ගිය නොව කිසි දිනෙක වලංගු නොවූ මාක්ස්වාදයෙන් හා එහි සඳහන් ප්‍රාග්ධනයෙන් ලෝකය දෙස බැලීමට උත්සාහ කරන බක පණ්ඩිතයන්ටය. ඇමරිකා එක්සත් ජනපදය අද නග්නව ම එම ක්‍රිස්තියානි සභ්‍යත්වය ලෝකයටම පෙන්වීමට සලස්වා ඇත. තවදුරටත් ඇමරිකන් රාජ්‍යය හා ක්‍රිස්තියානි පල්ලිය යනු එකිනෙකින් වෙන් වූ දෙයක් යැයි කිවහැක්කේ බටහිරයන් කියන ඕනෑම දෙයක් දොහොත් මුදුන් දී පිළිගන්නා කසිකබල් දේශපාලන විද්‍යාඥයන්ටය. අද බුෂ් කිසිම පැකිළීමක් නොමැතිව ඇමරිකන් හමුදා සඳහා පල්ලියේ ආශිර්වාදය ලබා ගනියි. ඔහු ක්‍රිස්තියානි ආගම ඉගැන්වීම සඳහා ඩොලර් බිලියන ගණනින් පාසල්වලට ආධාර කරයි. සංස්කෘතික පසුබිම සම්බන්ධයෙන් ගත් කල ඩාවිනීය පරිණාමවාදය හා දේව නිර්මාණය අතර වෙනසක් නැති නමුදු අද ඇමරිකාවේ ඇතැම් ප්‍රාන්තවල දේව නිර්මාණවාදය ඩාවිනීය පරිණාමවාදය සමග විකල්පයක් ලෙස ඉගැන්වෙන අතර එයට රජයේ සහාය ද ලැබෙයි. බුෂ් හා ඔහුගේ ගෝල බාලයෝ අද ඇමරිකාවේ වැඩි වී තිබෙන ලිංගික නිදහස සමාජයට තර්ජනයක් යැයි පවසමින් එයට විරුද්ධව කටයුතු කිරීම සඳහා විශාල වශයෙන් මුදල් යොදවති. මෙවැනි දේ අනුරූප ව ලංකාවේ බුදු දහම, සදාචාරය ආදිය වෙනුවෙන් මෙරට ඊනියා ආණ්ඩුව අද ක්‍රියාත්මක කෙළේ නම් රාජ්‍ය නොවන බුද්ධිමතුන් මෙන්ම විශ්වවිද්‍යාලවල සිටින ඔවුන්ගේ චක්ගෝලයන් ද හැට හැත්තෑවක පමණ සෙනඟක් ඇතිව කොටුව දුම්රියපොළ ඉදිරිපස දී දැකගැනීමට හැකිවීමට තිබුණි. එහෙත් අනාගතයේදී එය ඇමරිකාවේ සම්මතය වූ විට බුදුදහම කෙසේ වෙතත් සදාචාරය සම්බන්ධයෙන් නම් ඔවුන් ලිංගික නිදහසට විරුද්ධව පිකටිං පවත්වනු ඇත. බටහිරයන් අනුව කොණ්ඩය කැපීම, වැවීම, ඉතා කොටට කැපීම, ආදිය හැරෙන්නට මොවුන්ගේ ඇති ප්‍රබුද්ධකම කුමක්ද?

මේ සිදු වන්නේ තවත් කුරුස යුද්ධයකි. ඇෆ්ගනිස්තානයට පහර දුන්නේ බින් ලාඩන් ඒ රටෙහි ඇති නිසා යැයි ඇමරිකාව මුලදීම කියා සිටියේය. එහෙත් අල්ලාගත් බින් ලාඩන් කෙනෙක් නැත. පහර දීමෙන් සිදුවූ එකම දෙය ඇෆ්ගනිස්තානය විනාශ වීම පමණය. ඇමරිකාව ඉරාකයට පහර දුන්නේ එහි ජෛවීය හා න්‍යෂ්ටික අවි තිබේ යැයි කියමිනි. එවැනි අවි එහි ඇති බවට කිසිම ස්ථිර සාක්ෂියක් නැතිව තිබියදී ද ඇමරිකාව බ්‍රිතානිය සමග එක් වී ඉරාකය ආක්‍රමණය කළේය. එහෙත් ඉරාකය එවැනි අවිවලින් ඇමරිකන් හමුදාවන්ට පහර නොදුන්නේය. එපමණක් නොව මේ වන තුරුම එවැනි අවි ගබඩාවක් සොයා ගැනීමට ඇමරිකාවට නොහැකි වී ඇත. අද කසිකබල් ඒකපාක්ෂික සී. එන්. එන්. රූපවාහිනිය හරහා එවැනි අවි නිෂ්පාදනය කළ ගොඩනැගිලි යැයි කියමින් ගොඩනැගිලි කිහිපයක් පෙන්වීමට ඇමරිකානු රාජ්‍ය දෙපාර්තමේන්තුව ක්‍රියාත්මක කරයි. ඒ සියල්ල ඇමරිකානුන් හා සෙසු ලෝකවාසීන් රැවටීම සඳහාය. ඇමරිකාවේ අලුත්ම බෙර පදය වී ඇත්තේ සිරියාවේ ජෛවීය හා න්‍යෂ්ටික අවි තිබෙන බව කියා පෑමය. ගොනා හැරෙන්නේ කුමක් සඳහා දැයි තේරුම් ගැනීම අපහසු නොවේ.

ඉරාකයට එරෙහිව කළ යුද්ධයෙහිදී යුද විරෝධී ඇමරිකානුවන් සිරභාරයට ගත් බව සී. එන්. එන්. ඇතුළු ඇංග්ලෝ ඇමරිකානු ජනමාධ්‍ය ප්‍රචාරය කෙළේ ඉතා ලාවටය. මෙරට කොටුව දුම්රියපොළ ඉදිරිපිට බෙරිහන් දෙන යුද විරෝධීන් සතියකටවත් පිකටිං සඳහා ඇමරිකාවට යවා ගැනීමට හැකි වී නම් කාගෙ කාගේත් ප්‍රජාතන්ත්‍රවල ස්වරූපය කාට කාටත් දැනගැනීමට හැකි වීමට තිබිණි. ඒ කෙසේ වෙතත් ඇමරිකාවට එරෙහිව බොරුවට බෙරිහන් දුන් තරමින් ඇමරිකාවේ ආධිපත්‍යයෙන් ගැලවිය හැකි නොවේ. ඇෆ්ගනිස්තානය, ඉරාකය ළඟට ඇමරිකාවේ

© Prof. Nalin De Silva

ඉලක්කය වී ඇත්තේ සිරියාව හා ඉරානයයි. මේ රටවල් විනාශ කිරීම ඇමරිකාවේ අරමුණ වෙයි. ඇමරිකානුවන් කරන්නේ කුමක් ද යන්න මාක්ස්ගේ ප්‍රාග්ධනයෙන්වත් ඊනියා ධනවාදී අධිරාජ්‍යවාදයෙන්වත් පශ්චාත් නූතනවාදී බහුබූතවලින්වත් දැනගත හැකි නොවේ. බුෂ් පශ්චාත්නූතනවාදී දේශපාලනය තුට්ටු දෙකට දමා ඇත. මා මෙහිදී සඳහන් කරන්නේ එක්ස් කණ්ඩායම හෝ එවැනි වෙනත් අගුටුමිට් බුද්ධිමතුන්ගේ පශ්චාත්නූතනවාදයක් ගැන නොවේ. බටහිරයන් අනුකරණය කරන මේ ඇංකරලා දන්නේ බටහිරයන් අනුව කොණ්ඩය කැපීමට හා වැවීමට පමණකි. ඔවුන්ගේ යැයි කිවහැකි කිසිම අදහසක් නැති බැවින් ඔවුන්ගේ පශ්චාත්නූතනවාදයක් ගැන කතා කිරීමෙන් වැඩක් නැත. ඔවුන් ගැන කතා කළ යුතු වන්නේ ඔවුන්ගේ අඳබාලකම පෙන්වීමට අවශ්‍ය වූ විටක පමණය.

පශ්චාත්නූතනවාදී ලියෝනාරද් වැන්නන්ට අනුව අද ඇත්තේ කුෂුද්‍ර දේශපාලනයක් (මයික්‍රොපොලිටික්ස්) මිස මහේකෂ දේශපාලනයක් (මැක්‍රොපොලිටික්ස්) නොවේ. එහෙත් බුෂ් ඉරාකයේ දී කරන්නේ මහේකෂ ම මහේකෂ දේශපාලනයක් බව ලියෝනාරද් වැන්නන්ට නොවැටහේද? ලියෝනාරද් වැන්නන් මේ කසිකබල් මතවාද නිර්මාණය කරන්නේ අවිඥානිකව හෝ ඔවුන්ගේ රටවල නොව අප වැනි ආසියානු අප්‍රිකා රටවල ඊනියා උගතුන් නොමග යැවීමටය. බටහිරයෝ ආසියා අප්‍රිකා රටවලට බාල බෙහෙත් හා වෙනත් භාණ්ඩ වැනි දෑ නිර්මාණය කරන අයුරින් ම අපටම වූ දැනුම ද නිර්මාණය කරති. බටහිර රටවල ඊනියා පශ්චාත්නූතනවාදී දේශපාලනයකට ඉඩක් නැති නමුත් අප වැනි රටවල බොරු ප්‍රබුද්ධත්වයක මුවාවෙන් එවැනි දේශපාලනයකට ඉඩකඩ සැපයේ. කළ යුතු දේශපාලනය, එනම් බටහිර දේශපාලන, සංස්කෘතික හා ආර්ථික යටත්විජිතවාදයට එරෙහි වූ දේශපාලනය වෙනුවට මෙරට සංස්කෘතියට විරුද්ධව කෙරෙන දේශපාලනයක් නිර්මාණය කර එමගින් මෙරට සංස්කෘතිය දියකර හැරීමට හෝ දුර්වල කිරීමට හෝ කටයුතු කෙරෙන්නේ ලියෝනාරද්ලාට අවසාන විග්‍රහයෙහි දී ඒ අවශ්‍ය වැවිනි. කලක් මාක්ස්වාදය විසින් අපේ රටවල කෙරුණේ ද එවැනි දේශපාලනයකි. ජාතිය යන්න ඊනියා පාරභෞතිකයක් යැයි සඳහන් කරමින් කරගෙන ගිය මාක්ස්වාදී බහුබූත දේශපාලනයෙන් අවසානයේදී වාසි වූයේ බටහිර සංස්කෘතික යටත්විජිතවාදයට ම ය. මාක්ස් යනු ලෝකයේ සිටි අංක එකේ බටහිර සංස්කෘතික යටත්විජිතවාදියා විය. අද ලියොනාරද්ලා වැන්නන් කරන්නේ ද එයමය. බටහිර සංස්කෘතික යටත්විජිවාදය රැඳී ඇත්තේ මාක්ස්වාදය, පශ්චාත්නූතනවාදය වැනි බටහිර නොවන රටවල් සඳහා බටහිරම නිෂ්පාදනය කෙරෙන මතවාද උඩය. මතවාද, ප්‍රවාද, ජනප්‍රවාද, දැනුම ආදියෙහි වෙනසක් නොමැති බවද ඒවා අතර වෙනසක් ඇතැයි කියන්නේ බටහිර දැනුමේ ආධිපත්‍යය සඳහා පමණක් බව ද අවධාරණය කළ යුතුය. (පාරභෞතිකයක් ගැන නන්දොඩවන බොරු දාර්ශනිකයන්ට හා වෙනත් අයට ඉදිරිපත් කෙරෙන ප්‍රශ්නයක් වෙයි. පාරභෞතිකය හා භෞතිකය අතර ඇති වෙනස දැනගැනීම සඳහා නිර්ණායක ඉදිරිපත් කර ඒ නිර්ණායක ඇසුරෙන් ගුරුත්වාකර්ෂණය පාරභෞතිකයක් ද නැත්නම් භෞතිකයක් දැයි නිශ්චය කරන්න. වෙනත් අයගෙන් ඉදිරිපත් කෙරෙන හොඳම පිළිතුර සඳහා පියදාස සිරිසේන ත්‍යාගය ද බොරු දාර්ශනිකයන්ගෙන් ඉදිරිපත් කෙරෙන කසිම කසිකබල් පිළිතුර සඳහා මාක්ස් ඩෙරීඩා නාස් ලණුව ද ලියෝතාර්ද් අංතට්ටුව ද පිරිනැමෙනු ඇත. පිළිතුරු සිංහලෙන් හෝ ඉංගිරිසියෙන් හෝ චින්තන පර්ෂදයට ඉදිරිපත් කළ හැකිය.)

සදාම් හුසේන්ගෙන් පසුව ඉරාකයට වන්නේ ඉරාකය නමින් රටක් නැතිවීම පමණකි. ඉරාකය එක් රටක් ලෙස පවත්වාගෙන ගියේ සදාම් හුසේන්ය. ඔහු ඒකාධිපතියකු නම් ඔහු ඉවත් කළ යුතුව තිබුණේ ඉරාක ජනතාව මිස ඡන්ද පෙට්ටි ගණන් නොකිරීමෙන් ජනාධිපති වූ බුෂ් නොවේ. සදාම් හුසේන් ඉවත් කිරීමෙන් පසුව ඇමරිකන් ඉත්තකු බලයෙහි තැබුව ද ඊළඟට සිදුවන්නේ ඉරාකය කැබලි වීමය. විවිධ ගෝත්‍රවල, ඉස්ලාම් ආගමේම විවිධ නිකායවල ජනයා ඊනියා ස්වයං තීරණ අයිතිය වෙනුවෙන් ඉදිරිපත්වනු ඇත්තේ ඇමරිකාවේ ආශිර්වාදය මැදය. (ස්වයං නිර්ණ අයිතිය අද බටහිරයන්ගේ අවශ්‍යතාවය අනුව ඉදිරිපත් කෙරෙන්නක් බවට පත්වෙමින් ඇත.) ඉරාකයේ ඇති හමුදා මූල කඳවුරු පදනම් කරගෙන ඇමරිකාව ඉරානය හා සිරියාව ද තම ග්‍රහණයට හසුකර ගැනීමට කටයුතු කරනු ඇත. එය කාලය පිළිබඳ ප්‍රශ්නයක් පමණක් වෙයි. කලින් සඳහන් කළ ආකාරයට මේ ක්‍රියාදාමය තෙල් ළිං ඇසුරෙන් පමණක් තේරුම් ගත නොහැකිය. ඊනියා ප්‍රාග්ධනයට හසු නොවන වැදගත්කම හා වටිනාකම් ලෝකයෙහි වෙයි. චිත්‍ර, කෞතුක වස්තු වැනි ඇතැම් දෑහි වටිනාකම මුදලින් තක්සේරු කෙරුණ ද එහි එයට වඩා වෙනත් වටිනාකම් ඇත. සාහිත්‍යයට, සිනමාවට ආදී වශයෙන් ඊනියා ජාත්‍යන්තර තෑගි දෙන්නේ හුදු මූල්‍ය වටිනාකම සළකමින් නොවේ. සමාජයේ පොරකගේ වටිනාකම තක්සේරු කරන්නේ කෙසේද? අද මුස්ලිම් රටවල සිදුවන්නේ තෙල් ළිං ආක්‍රමණයක් පමණක් යැයි පවසන්නේ මාක්ස්ගේ ප්‍රාග්ධනය ගැන අසා ඇති බොරු පණ්ඩිතයන් පමණකි. ලෝකයේ සංස්කෘතික හා සභ්‍යත්ව ගැටුම් සැමදාමත් තිබී ඇත. සැමුවෙල් හන්ටින්ටන් ඉදිරියේ එන සභ්‍යත්ව ගැටුමක් ගැන පොතක් ලියුවේ

© Prof. Nalin De Silva

අප මුළා කිරීමටය. සෝවියට දේශය බා බර්ලින් තාප්පය කඩා බිඳ දැමීමෙන් පසුව බටහිර ඇංග්ලො ඇමරිකන් සංස්කෘතියට ප්‍රධානම අභියෝගය වුයේ මුස්ලිම් සංස්කෘතියය. (සෝවියට් සභ්‍යත්වය ඊනියා කොමියුනිස්ට් සභ්‍යත්වයක් නොව නැගෙනහිර යුරෝපීය ඕතොඩොක්ස් සභ්‍යත්වයක් විය.) අද වන විට චීනය හා ඉන්දියාව ද යම් ප්‍රමාණයකට ඇංග්ලො ඇමරිකානුවන් විසින් මෙල්ල කෙරී ඇත. ඉරාකය ආක්‍රමණය කිරීමට එරෙහිව චීනය හා ඉන්දියාව දැඩි ප්‍රතිපත්තියක් අනුගමනය නොකෙළේය. ඉන්දීය නායකයන් කියා ඇත්තේ ජාතික අවශ්‍යතා නිසා එසේ නොකළ බවය. ඇංග්ලො ඇමරිකානුවෝ දශක කිහිපයක් තිස්සේ මැලේසියාව, ඉන්දුනීසියාව යන මුස්ලිම් රටවල් ද බෞද්ධ තායිලන්තය ද අග්නිදිග ආසියාවේ ප්‍රධාන රටවල් ලෙස උස්සා තැබීමට මහන්සි ගත්හ. ඒ ඉන්දියාවට හා චීනයට එරෙහිවය. අද එවැන්නක් අවශ්‍ය නොවේ. ඉන්දියාව හා චීනය යම් ප්‍රමාණයකට මෙල්ල වී ඇත. ඒ නිසාම අද ඇමරිකානුවන්ට මැලේසියාවෙන්, ඉන්දුනීසියාවෙන් හා තායිලන්තයෙන් ප්‍රයෝජනයක් නැත. අද ඔවුහු මේ රටවල් ගැන සැලකිල්ලක් නොදක්වති.

ඇංග්ලො ඇමරිකානුවන්ට ප්‍රශ්නයක් වී තිබුණේ මැදපෙරදිග ඇමරිකාවට නොනැමෙන මුස්ලිම් රටවල්ය. ක්‍රිස්තියානි සභ්‍යත්වය මෙන්ම මුස්ලිම් සභ්‍යත්වය ද ලෝක ආධිපත්‍යය සඳහා සටන් වදියි. හින්දු හෝ චීන සභ්‍යත්වවලට එවැනි අරමුණක් නොමැති බවද සඳහන් කළ යුතුය. සෝවියට් දේශය බිඳ දැමීමෙන් පසුව ඇමරිකාවට තම ලෝක ආධිපත්‍යය වෙනුවෙන් විනාශ කර දැමිය යුතු රටවල් වුයේ තමන්ට නොනැමෙන නායකයන් සිටි මැදපෙරදිග මුස්ලිම් රටවල්ය. අද ඇමරිකාව හා බ්‍රිතානිය එක් වී අරාබිකරයේ කරන්නේ මෙයයි. ඇංග්ලො ඇමරිකානුවන් ඒ රටවල නායකයන් ඉවත් කිරීම පමණක් නොව ඒ රටවල් කැබලි කිරීම දරණු ඇත. සෝවියට් දේශය හා යුගෝස්ලෝවියාව මෙන් ඉරාකය පමණක් නොව සිරියාව හා ඉරානය ද කැබලි කිරීම හා එමගින් තමන්ට විරුද්ධ බලවේග දුර්වල කිරීම ඇංග්ලො ඇමරිකානුවන්ගේ අභිප්‍රාය වෙයි.

මෙයට පිළිතුරක් නැත්ද? මා දකින අයුරින් නම් මේ සියවස තුළ ඇංග්ලො ඇමරිකන් ආධිපත්‍යය පරාජය වනු ඇත. එහෙත් එය එක

රැයකින් සිදු වන්නක් නොවේ. එමෙන්ම එය ඉබේට සිදුවන්නක් ද නොවේ. අවුරුදු පන්සියයකට වඩා පැරණි බටහිර යටත්විජිතවාදය පරාජය කළ හැකිය. එහෙත් ඒ සඳහා පළමුවෙන්ම කළ යුතු දෙය නම් අප ඔවුන්ගේ දැනුම් ආධිපත්‍යයෙන් මිදී අපේ ම වූ දැනුම නිර්මාණය කිරීමය. මුස්ලිම්වරු ඊනියා මුස්ලිම් විද්‍යාවක් ගැන කතා කළහ. එහෙත් ඔවුන් එයට අත ගැසුවේ නිවැරදි ආකාරයකට නොවේ. මුස්ලිම්, හින්දු හෝ සිංහල බෞද්ධ විද්‍යා යනු අප බටහිර දැනුම කෝරාණයේ හෝ භගවත්ගීතයේ හෝ පාලි ත්‍රිපිටකයේ හෝ තිබෙන බව පෙන්වීමට කැසකැවීම නොවේ. ඒ ඒ සංස්කෘතීන් මත පිහිටා අපි අපේ දැනුම නිර්මාණය කළ යුතු වෙමු. එහිදී අවශ්‍ය පරිදි බටහිර දැනුම ද අවශෝෂණය කරගත යුතු වෙයි. මාක්ස්ගේ හෝ ලියෝනාර්ද්ගේ වෙනත් බටහිරයකුගේ දැනුම මත පදනම් වී අපට අත්කර ගත හැකි විමුක්තියක් නැත. අප බටහිර යටත්විජිතවාදයට බැඳ තැබෙන්නේ ප්‍රගතිශීලී යැයි කියැවෙන මේ දැනුම් ද ආධාර කර ගනිමිනි. බටහිර යටත්විජිතවාදයෙන් මිදීම සඳහා අපි දැනුම නිර්මාණය කරමු. ඒ සමග මෙරට සිටින වඳ අනුකාරක ඇංකර අඟුටුමිට්ටන් එක එකා ගංවඩු ගසා හෙළිදරව් කරමු.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva